AL/N/23A

නව

| රහස්‍ය ලේඛනයකි | සියලුම හිමිකම් ඇවිරිණි | සංශෝධනයන්ට යටත් ය |
| --- | --- | --- |

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## ජාතික ඇගයීම් හා පර්යේෂණ සේවාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය -- 2013
## ලකුණු දීමේ පටිපාටිය



# 25
# ශ්‍රී ලංකාවේ ඉතිහාසය (නව නිර්දේශය)

මෙය උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි. ප්‍රධාන පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි ඇතැම් වෙනස්කම් කරනු ලැබේ. මෙය පන්ති කාමර ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා ආධාරකයක් ලෙස යොදා ගත හැකිය යනු අපගේ විශ්වාසයයි.

Scanned with CamScanner

Department of Examinations, Sri Lanka


**New Syllabus**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2013 ஓகஸ்ற்
**General Certificate of Education (Adv. Level) Examination, August 2013**

ඉතිහාසය / வரலாறு / History | III | 25 | S

විභාග අංකය / சுட்டெண் / Index No.

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. **01**



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2013 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2013

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ඉතිහාසය I (II කොටස)
வரலாறு I (பகுதி II)
History I (Part II)

25 S I

ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා

උපදෙස්:
✳ පළමුවන ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.
(පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ දළ සිතියමක් සපයා ඇත.)

## II කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමති දෙකක් පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

| | |
|---|---|
| (i) ජම්බුකෝලපට්ඨන | (ii) ජජ්ජර නදී |
| (iii) පරාක්‍රම සමුද්‍රය | (iv) ගම්පොළ |
| (v) කල්පිටිය | (vi) හම්බන්තොට |
| (vii) සීතාවක | (viii) තැගෙනහිර පළාත |

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි.)*

2. "මහාවංසයේ මුල් කොටස මහා විහාරයේ වංශකථාවයි."

(i) *මහාවංසයේ කතුවරයා නම් කරන්න.*

දික්සඳ පිරිවෙන්පති මහානාම හිමි.

*(ලකුණු 01 යි)*

(ii) *මහාවංසය රචනා කරන ලද්දේ කුමන රජුගේ රාජ්‍ය සමයේදී ද?*

ධාතුසේන රාජ්‍ය සමයේ දීය.

*(ලකුණු 01 යි)*

Scanned with CamScanner

(iii) මහාවංසයට ලියන ලද ටීකාව නම් කරන්න.

වංසත්ථප්පකාසිනී.

මහාවංශ ටීකා නම ලියුවාට ලකුණු නොදිය යුතුය

(ලකුණු 01 යි)

(iv) මහාවිහාරය පිළිබඳ ව කෙටි විස්තරයක් ලියන්න.

- ❖ මහාවිහාරයේ ආරම්භය දේවානම්පිය තිස්ස රාජ්‍ය සමයට අයත් වීම.
- ❖ මහාවිහාරය පිහිටි මහාමෙවුනා උයන මිහිඳු හිමියන්ගේ උපදෙස් පිට රන් නඟුලකින් සීමා සලකුණු කොට රජු විසින් භික්ෂූන් වෙත පූජාකරනු ලැබීම.
- ❖ ථූපාරාමය, මහාබෝධිය, මහාථූපය, ලෝවාමහාප්‍රාසාදය හා මිරිසවැටිය මහාවිහාර සීමාව තුළ ඉදි කරනු ලැබූ ප්‍රධාන ආගමික සිද්ධස්ථාන වීම.
- ❖ මහාවිහාරය තුළ වැඩ විසූ භික්ෂූන් මහාවිහාරිකයින් ලෙසින් හැඳින්වීම.
- ❖ මහාවිහාරීය භික්ෂූන් ථෙරවාදී සම්ප්‍රදාය ආරක්ෂා කිරීම.
- ❖ මහසේන රජු සංඝමිත්‍ර නම් භික්ෂුවගේ උපදෙස් මත මහාවිහාරය විනාශ කිරීම හා එම භූමියේ ජේතවන විහාරය ගොඩ නැඟීම.

(ලකුණු 03 යි)

(v) මහසෙන් රාජ්‍ය සමයේ අවසානය දක්වා ආගමික හා දේශපාලනික යන දෙඅංශයේ ම ඉතිහාසය හැදෑරීමෙහි ලා මහාවංසයේ ඇති වැදගත්කම කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත සඳහන් ප්‍රකාශය විවේචනාත්මක ව විමසන්න.

- ❖ *මහාවංසයේ* පළමු කොටස පරිච්ඡේද 37 කින් සමන්විත වේ.
- ❖ බුදුරදුන්ගේ ලංකා ගමනයේ සිට මහසේන රජ සමයේ අවසානය දක්වා මහාවිහාරය කේන්ද්‍රකොටගත් ආගමික ඉතිහාසය හා මහාවිහාරයට උදව්කළ පාලකයන් හා ඔවුන් විසින් කරන ලද සේවය මෙම ග්‍රන්ථය තුළ අන්තර්ගතව තිබීම.
- ❖ මහාවිහාරයේ ආරම්භයත් වර්ධනයත් මහසෙන් රාජ සමයේ ඇති වූ විනාශයත් මෙහි තේමා කරගෙන තිබීම.
- ❖ මහා විහාරයේ උච්චතම අවස්ථාව දුට්ඨගාමණී සමයේ සනිටුහන්වීම නිසා පරිච්ඡේද එකළොහක්ම ඒ රජු සඳහා වෙන් කොට තිබීම.

Scanned with CamScanner

❖ මහාවිහාරයේ අභිවෘද්ධියට ක්‍රියා කළ දේවානම්පිය තිස්ස, කූටකණ්ණ තිස්ස, භාතිකාභය, වංකනාසික තිස්ස, වසභ, සිරි සංඝබෝධි වැනි පාලකයනට වැඩි අවධානයක් යොමු කොට ඇති අතර අනෙකුත් නිකායිකයනට සහාය දැක්වූ වට්ටගාමිණී, ගජබාහු, කණිට්ඨතිස්ස වැනි චරිතවලට අඩු අවධානයක් යොමු කොට තිබීම.

❖ අභයගිරිය, ජේතවන හා වෙනත් නිකායිකයන් හා විහාර ගැන අඩු සැලකිල්ලක් දක්වා තිබීම හා මහා මහාවිහාරීය ජයග්‍රහණ ගැන වැඩි අවධානයක් යොමුව පැවැතීම.

❖ මෙකී සාධක පදනම් කරගෙන *මහාවංසය* මහාවිහාරීය වංශකථාව ලෙසින් හඳුනාගත හැකිවීම.

❖ එහෙත් පහත දක්වෙන කරුණු මත *මහාවංසය* මුළුමනින්ම මහාවිහාරයේ වංශකතාව ලෙස හැඳින්වීම යෝග්‍ය නොවේ.

❖ මහාවිහාරය හා සම්බන්ධ තොරතුරු හැරෙන්නට වෙනත් ආගමික තොරතුරුද යම් ප්‍රමාණයකට ඉදිරිපත් කොට තිබීම.

❖ ලක්දිව දේශපාලන ඉතිහාසය කාලානුක්‍රමිකව ඉදිරිපත් කර තිබීම.

❖ *මහාවංසය* පුද්ගල නාම හා ස්ථාන නාම හඳුනාගැනීමේ දී වැදගත්වීම.

❖ අභිලේඛනවල සඳහන් පාලක නාම හඳුනා ගැනීම හා පාලක ඥාති සම්බන්ධතා තහවුරු කරගැනීමේ දී වැදගත්වීම (හබැස්ස, මොලාහිටියවෙලේගල, රුවන්වැලි සෑ මළුවේ ගජබාහුගේ ලිපිය, සිතුල්පව්ව ලිපිය)

[ආගමික හා දේශපාලන කරුණු සසඳමින් විචාරාත්මක විග්‍රහයක් ඉදිරිපත් කරන පිළිතුරුවලට වැඩි ලකුණු ලබාදිය යුතුය.]

*(ලකුණු 08 යි)*

**3. දේවානම්පිය තිස්ස රජතුමාගේ රාජ්‍ය සමයේ ඇති ඓතිහාසික වැදගත්කම පහත දක්වෙන තේමා යටතේ සාකච්ඡා කරන්න.**

**(i) බුද්ධාගම හඳුන්වාදීම**
**(ii) සංස්කෘතික අභිවර්ධනය**
**(iii) රාජත්වය ශක්තිමත් කිරීම**

*(ලකුණු 14 යි)*

❖ අශෝක අධිරාජයා සහ දේවානම්පිය තිස්ස අතර මිත්‍ර සම්බන්ධතාව දෙරට අතර සම්බන්ධතාවලට අවශ්‍ය පසුබිම සකස් කිරීම.

❖ සංවිධානාත්මක ආගමක් ලෙස බුදුසමය ස්ථාපනය කොට සංඝ ශාසනය පිහිටුවීම.

❖ මුළු අනුරාධපුර නගරයම ඇතුළත් වන පරිදි සීමා පිහිටුවීම සහ මහමෙව්නාව සඟ සතු කිරීම.

Scanned with CamScanner

❖ දේවානම්පිය තිස්ස රජු ඇතුළු ප්‍රභූන් බුද්ධාගම වැළඳගැනීම. ඒ සමගම බුදුදහම රාජ්‍ය ආගම ලෙස පිළිගැනීම හා එම දහම ව්‍යාප්ත වීම.

❖ ථෙරවාදී බුදුදහමේ මධ්‍යස්ථානය ලෙස මහාවිහාරය පිහිටුවීම.

❖ සංඝමිත්තා තෙරණියගේ පැමිණීම හා දුමින්දාගමනය.

❖ භික්ෂුණී ශාසනය පිහිටුවීම.

❖ බුදුදහම පදනම් කොටගත් සංස්කෘතියක් බිහිවීමඃ බෞද්ධ අධ්‍යාපන ක්‍රමය, අක්ෂර කලාව, භාෂාව, ලේඛන කලාව, සාහිත්‍යය, බෞද්ධාගමික උත්සව, ගෘහනිර්මාණ ශිල්පය, චිත්‍ර-මූර්ති-කැටයම්, පුදපූජා හා වත්පිළිවෙත් ආදී දෑ ඇතිවීම.

❖ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා වශයෙන් සිව් පිරිසක් බිහිවීම.

❖ ආගමික කටයුතු මගින් බුදුදහම හා රාජත්වය සම්බන්ධවීම.

❖ තිස්ස රජුගේ දෙවන අභිෂේකය හා ලක්දිව රාජත්වය ස්ථාපිත වීම.

❖ ප්‍රාදේශීය රාජධානිවල පාලකයන් අභිබවා අනුරාධපුර පාලකයා පෙරට පැමිණීම. මෙහිදී ඉන්දියානු සම්බන්ධය තීරණාත්මක සාධකයක් වීම හා අභිෂේකය හඳුන්වාදීමෙන් මේ සඳහා පසුබිම සකස්ව තිබීම.

*(ලකුණු 14 යි)*

**4. මහසෙන් රජතුමාගේ ආර්ථික හා ආගමික කාර්ය සංසිද්ධිය විවේචනාත්මක ව පරීක්ෂා කරන්න.**

❖ මහාවිහාරයට එරෙහිව කරන ලද කටයුතු නිසා මේ රජු පිළිබඳව *මහාවංසයේ* ඇත්තේ කෙටි විස්තරයකි. කෙසේවෙතත් පහත දැක්වෙන තොරතුරු ඊට ඇතුළත්යඃ

- ආර්ථිකඃ
  - ✓ මින්නේරිය, මහාගල්ලක, හුරුල්ල, ඛාණු (කණදරා), මාමිණියා, කෝකවාත, මොරවාපි, කිඹුල්වානාව, වාහ, රත්නමාලකණ්ඩ, තිස්සවඩ්ඪමානක (රන්තිසා/කවුඩුලු), මහදාරගල්ල (මහගල්කඩවල), ඛිරවාපි, කාලපාසාණ ඇතුළු වැව් 16 ක් සහ පබ්බතන්ත ඇළ පිළිබඳ සඳහන්වීම. මෙකී වාරිමාර්ග කටයුතු මගින් කෘෂිකර්මාන්තය නඟාසිටුවීමට කටයුතු කිරීම.
  - ✓ අනුරාධපුරයෙන් බැහැර පොළොන්නරු ප්‍රදේශයට වාරි කටයුතු ව්‍යාප්ත කිරීම.
  - ✓ මෙබඳු කටයුතු හේතුකොට ගෙන 'මින්නේරි දෙයියෝ', 'හත්රජ්ජුරු බණ්ඩාර' යන ගෞරව නාමවලින් රජු හැඳින්වීම.

- ආගමිකඃ
  - ✓ සංඝමිත්ත භික්ෂුවගේ පෙළඹවීම් හා සෝණ ඇමතිගේ සහාය ඇතිව කටයුතු කිරීම; මහාවිහාරයට අවිනයවාදී චෝදනා එල්ලකිරීම; මහාවිහාරවාසී භික්ෂූන්ට එම ස්ථානය අතහැර යාමට කටයුතු සැලැස්වීම; මහාවිහාර ගොඩනැගිලි විනාශකිරීමට කටයුතු කිරීම.
  - ✓ මහාවිහාරවාසී භික්ෂූන්ට දන්දෙන අයට කහවණු 100ක් දඩගැසීමට නියම කිරීම.

Scanned with CamScanner

- ✓ වෛතුල්‍යවාදී කණ්ඩායම බලවත්වීම හා රජුගේ අනුග්‍රහය ඔවුනට හිමිවීම, මහාවිහාර සීමාව උල්ලංඝණයකොට ජේතවනය පිහිටුවා සාගලික නිකායේ කොහොන් තිස්ස තෙරුණ්ට පූජාකිරීම.
- ✓ මින්නේරිය විහාරය, කෝකවාත විහාරය, රූපාරම්ම විහාරය හා චූලවිට්ටි විහාරය පිහිටුවීම, උත්තර හා අභය යන භික්ෂුණී විහාර දෙක පිහිටුවීම.
- ✓ කාලවේල යක්ෂයාගේ වාසස්ථානය පිහිටි තැන ස්තූපයක් කරවීම හා ජරාවාස වූ වෙහෙරවිහාර ප්‍රතිසංස්කරණය කිරීම.
- ✓ භික්ෂූන් 1000 කට දහසක් වටිනා දෑ පූජාකිරීම හා භික්ෂූන්ට වාර්ෂිකව චීවර පූජාකිරීම හා සිව්පසයෙන් සංග්‍රහ කිරීම.
- ✓ ගෝකණ්ණ, ඒරකාවිල්ල හා කලන්දික යන බ්‍රාහ්මණ ග්‍රාමවල පිහිටි දේවාල තුනක් විනාශකොට විහාර තුනක් ඉදිකිරීම.

- මේ රජු බොහෝ පින්දු පව්දු රැස්කර ගෙන මියපරලොව ගිය බව *මහාවංසයේ* සඳහන්වීම.

*(ලකුණු 14 යි)*

**5. පොළොන්නරු පාලකයන්ගේ විදේශ ප්‍රතිපත්තිය පහත දැක්වෙන තේමා යටතේ විග්‍රහ කරන්න.**

**(i) විදේශ රටවල් ආක්‍රමණය කිරීම**
**(ii) විවාහ සම්බන්ධතා**
**(iii) සංස්කෘතික සම්බන්ධතා**

මේ අවධිය තුළ විදේශ සම්බන්ධතා පැවැත් වූ රජවරු - පළමු වන විජයබාහු රජතුමා, පළමු වන පරාක්‍රමබාහු රජතුමා, හා නිශ්ශංකමල්ල රජතුමා.

❖ විදේශ රටවල් ආක්‍රමණය කිරීම

- කර්ණාට රටබලා යමින් සිටි දූත පිරිසකට චෝළ දේශයේ දී හිරිහැර කිරීම නිසා පළමු වන විජයබාහු රජතුමා චෝළ දේශය ආක්‍රමණය කිරීමට සූදානම් වුවත් එය අසාර්ථක වීම හා චෝළ ආක්‍රමණ වළක්වා ගැනීමේ අරමුණින් මහාතිත්ථයේ සේනාංක නවතා තැබීම.
- පළමු වන පරාක්‍රමබාහු රජතුමා විසින් බුරුම රට හා පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණ කරනු ලැබීම.
- නිශ්ශංකමල්ල රජතුමා චෝළ හා පාණ්ඩ්‍ය රාජ්‍ය ආක්‍රමණය කිරීම.

Scanned with CamScanner

6.

❖ විවාහ සම්බන්ධතා

- පළමු වන විජයබාහු රජතුමා:
    - ✓ අයෝධ්‍යාවේ ජගතිපාල රජුගේ දියණිය ලීලාවතී විවාහ කර ගැනීම.
    - ✓ තිලෝක සුන්දරී නම් කාලිංග දේශයේ කුමාරිකාවක් විවාහ කර ගැනීම.
    - ✓ සුන්දරී නම් කාලිංග කුමරියක් තම පුත් වික්‍රමබාහුට විවාහ කරදීම.
    - ✓ තම නැගණිය මිත්තා කුමරිය පාණ්ඩ්‍ය කුමාරයකුහට විවාහ කරදීම.
    - ✓ ලීලාවතී බිසවගේ දියණිය යශෝදරා කුමරිය වීරවම්මට විවාහ කරදීම.

- පළමු වන පරාක්‍රමබාහු රජතුමා:
    - ✓ කාලිංගය සමඟ විවාහ සම්බන්ධතා පැවැත් වූ බව.

- නිශ්ශංකමල්ල රජතුමා:
    - ✓ කාලිංග සුභද්‍රා, කල්‍යාණවතී (ගංග) විවාහ කර ගැනීම.
    - ✓ වෙංගි, කර්ණාට, ගුර්ජර යන රාජවංශ සමඟ විවාහ සම්බන්ධතා පැවැත්වීම.

❖ සංස්කෘතික සම්බන්ධතා

- පළමු වන විජයබාහු රජතුමා:
    - ✓ බුරුම රජුගේ සහයෝගයෙන් උපසම්පදා කර්මය නැවත ඇති කිරීම.
    - ✓ මුතු, මැණික් රැගත් දූත පිරිස් දඹදිව යවා ශ්‍රී මහා බෝධියට පුදපූජා පැවැත්වීම.

- පළමු වන පරාක්‍රමබාහු රජතුමා:
    - ✓ කාම්බෝජය සමඟ මිත්‍ර සම්බන්ධතා පැවැත්වීම.
    - ✓ බුරුමය සමඟ ආගමික සම්බන්ධතා පැවැත්වීම.

- නිශ්ශංකමල්ල රජතුමා:
    - ✓ දකුණු ඉන්දියාවේ දේවාලයක් ප්‍රතිසංස්කරණය කර එය නිශ්ශංකේශ්වර ලෙසින් නම් කිරීම.
    - ✓ නෙල්ලූර්, ගෞඩ, ආන්ධ්‍ර, ගුර්ජර, අරමණ, කාම්බෝජය යන රටවල් සමඟ මිත්‍ර සම්බන්ධතා පැවැත් වූ බව.
    - ✓ මෙලෙස මේ යුගයේ පාලකයෝ විවිධ අන්දමේ සම්බන්ධතා පැවැත්වීමේ මූලික අරමුණ වූයේ චෝළ සතුරු රාජ්‍ය සමඟ මිත්‍ර සම්බන්ධතා පවත්වා ගනිමින් චෝළ විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමය.

*(ලකුණු 14 යි)*

Scanned with CamScanner

6. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) චන්ද්‍රභානු
(ii) ආර්යචක්‍රවර්ති පාලකයෝ
(iii) කුරුණෑගල යුගයේ සාහිත්‍යය
(iv) කෝට්ටේ යුගයේ අධ්‍යාපනය
(v) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා

*(එක් සටහනකට ලකුණු 07 බැගින්)*

(i) චන්ද්‍රභානු

- ❖ ලංකාවට අග්නිදිග ආසියාතික ප්‍රදේශයකින් ආක්‍රමණයක් එල්ල කළ පළමු ආක්‍රමණිකයාය.
- ❖ අග්නිදිග ආසියාවේ මලය අර්ධද්වීපයේ ලිගෝර් (තාම්බ්‍රලිඞ්ග) ප්‍රදේශයේ පාලකයෙකි.
- ❖ දඹදෙණියේ රජකළ දෙවන පරාක්‍රමබාහු රජ දවස ආක්‍රමණ දෙකක් එල්ල කිරීම.
  - පළමුවන ආක්‍රමණය:
    - ✓ තමා බෞද්ධයෙකු බව ප්‍රකාශ කරමින් ආක්‍රමණයට අවතීර්ණවීම.
    - ✓ දරුණු ප්‍රහාර එල්ලකිරීම.
    - ✓ දෙවන පරාක්‍රමබාහු රජුගේ බෑණා වූ වීරබාහු කුමරු විසින් මොහු පරාජයට පත්කොට පළවාහරිනු ලැබීම.
  - දෙවන ආක්‍රමණය:
    - ✓ මුල් අවස්ථාවට වඩා සංවිධානාත්මක ආක්‍රමණයක් එල්ලකිරීම.
    - ✓ දළදා, පාත්‍රා ධාතූන් වහන්සේ ඉල්ලා තර්ජනය කිරීම.
    - ✓ මෙවරද වීරබාහු කුමරු හා දෙවන පරාක්‍රමබාහු රජුගේ පුත් විජයබාහු කුමරු එක්ව සටන් මෙහෙයවා චන්ද්‍රභානු පරාජයට පත් කිරීම.
    - ✓ මේ සටනේදී මොහු ජීවිතක්ෂයට පත්වීම.

*(ලකුණු 07 යි)*

(ii) ආර්යචක්‍රවර්ති පාලකයෝ

- ❖ ආර්යචක්‍රවර්තීන් පිළිබඳ තොරතුරු සපයන ප්‍රධාන මූලාශ්‍රය *යාල්පානවෛපවමාලෛ* සහ *ශෛගරාශසේගරමාලෛ* ය.
- ❖ ආර්යචක්‍රවර්ති පාලකයන් දොළොස් දෙනෙකු පිළිබඳ තොරතුරු හමුවේ.

1. ශිංගෛ ආරියණ් (චිංකෛයාරියර්) නමින් ප්‍රකට වූ විජය කුලංගෛ පළමු පාලකයා වීම. 14 වන සියවසදී යාපනය කේන්ද්‍ර කොටගෙන රාජධානියක් පිහිට වූ මොහු නල්ලූර් කන්දස්වාමි කෝවිල ඇතුළු කෝවිල් කිහිපයක් කරවීම.

Scanned with CamScanner

2. කුලසේකර සිංහෛ ආරියන්, පරිපාලනය හා කෘෂිකර්මාන්තය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.

3. වික්කිරම සිංහෛ ආරියන්, දෙමළ-සිංහල වැසියන් අතර හටගත් මතභේද සමනය කොට දෙපිරිස අතර සාමයක් ඇතිකිරීමට සමත්වීම.

4. වරෝදය සිංහෛ ආරියන් සිංහල-දෙමළ සමගිය වර්ධනය කිරීමට සමත්වීම.

5. මාර්තාණ්ඩ සිංහෛ ආරියන් අධ්‍යාපනයත් කෘෂිකර්මාන්තයත් දියුණු කළ අතරම වන්නියාර්වරුන්ගේ බලය සීමාකිරීමට සමත් වීම.

6. කුණපූෂණ සිංහෛ ආරියන් යාපන රාජධානියේ සමෘද්ධිමත් කාලයක් උදාකිරීමට සමත්වීම.

7. ජීරෝදය සිංහෛ ආරියන් වන්නියාර්වරුන් සිංහල වැසියන් ලවා ඇතිකළ කැරැල්ල මර්දනය කිරීම හා චන්ද්‍රශේකර නම් පාණ්ඩ්‍ය රජෙකුට රාජ්‍යය ලබාගැනීමට ආධාර දීම.

8. ජයවීර (චෙයවීර) සිංහෛ ආරියන් මුතුපර සම්බන්ධයෙන් භුවනෛකබාහු රජු සමග ඇතිකරගත් සටනේ ප්‍රතිඵලයක් ලෙස සිය ආධිපත්‍යය වසර 12 ක් තිස්සේ දිවයිනේ ක්‍රියාත්මක කිරීමට සමත් වීම.

9. කුණවීර සිංහෛ ආරියන් දිවයිනේ දකුණේ ප්‍රදේශ කිහිපයකට පහරදී එම ප්‍රදේශවල දෙමළ ජනයා පදිංචි කරවීමට සමත්වීම.

10. කනාගසූරිය (කණකසූරිය) සිංහෛ ආරියන් වන්නියාර්වරුන්ගේ මෙහෙයවීමෙන් ඇති වූ සිංහලයන්ගේ කැරැල්ල හේතුවෙන් ඉන්දියාවට පලාගොස්, වසර 17 කට පසුව පෙරළා පැමිණ රාජ්‍යය භාරගැනීම.

11. පරාජශේකරණ්ගේ සමයේ ඔහුගේ සහෝදරයකු යාපනේ දෙමළ ශාස්ත්‍රාලයක් පිහිටුවා දකුණු ඉන්දියාවෙන් දෙමළ පොත් විශාල සංඛ්‍යාවක් ගෙන්වීම හා ග්‍රන්ථකරණයේ නිරතවීම; ඔහුගේ බෑණා වූ අරිශකේශරී සංස්කෘත රඝුවංශය දෙමළට පරිවර්තනය කිරීම. මේ කරුණුවලින් එකල පැවති සාහිත්‍ය ප්‍රබෝධය පැහැදිලි වීම.

12. සංකිලි 1519 දී පරරාජශේකරණ් මරා රජවීම. මේ අවධියේදී පෘතුගීසීන් යාපනය ආක්‍රමණය කිරීම. අභ්‍යන්තර අර්බුද හේතුකොටගෙන 15[illegible] දී මොහුට රාජ්‍යය අහිමිවීම.

❖ 1344 දී දිවයිනට පැමිණි ඉබන් බතූතා ආර්යචක්‍රවර්තීන් 'ලංකාවේ සුල්තාන්' ලෙස හඳුන්වා තිබීම.

❖ තෙවන වික්‍රමබාහු රජ දවස ගම්පොළ රාජධානියට පහරදී එහි ඇතැම් ප්‍රදේශවලින් බදු අයකර ගැනීමට මෙම පාලකයන් සමත්වීම.

❖ සයවන පරාක්‍රමබාහු රජු සපුමල් කුමරු යවා ආර්යචක්‍රවර්තීන් පරාජය කිරීමට සමත්වීම.

*(ලකුණු 07 යි)*

Scanned with CamScanner

### (iii) කුරුණෑගල යුගයේ සාහිත්‍යය

- ❖ දඹදෙණි යුගයේදී සිදුවෙමින් පැවති සාහිත්‍ය කටයුතුවල වර්ධනයක් කුරුණෑගල යුගයේදී දක්නට ලැබීම.
- ❖ සිව්වන පරාක්‍රමබාහු රජ සමයේ ඇති වූ දේශපාලන අභිවර්ධනය හා ශාසනික සේවය, භාෂා සාහිත්‍යයේ ප්‍රවර්ධනයට හේතුවීම.
- ❖ චෝළ දේශයේ උගත් මහතෙර නමක වූ ධර්මකීර්ති හිමි ලක්දිවට වැඩමවා රාජගුරු පදවිය පිරිනැමීම හා උන්වහන්සේ ලවා ජාතක කතා දේශනා කරවා සිංහල *පන්සිය පණස් ජාතක කතා පොත* රචනා කිරීම.
- ❖ *එළුබෝධිවංශය, අනාගතවංශය, සිංහල ථූපවංශය, සිංහල බෝධිවංශය, දළදාසිරිත, උම්මග්ග ජාතකය,* පාලි *ධාතුමඤ්ජුසා* වැනි කෘතීන් ගණනාවක් රචනා කිරීම.
- ❖ ජ්‍යොතිෂ්ශාස්ත්‍රය අළලා *සරජෝතිමාලෙයි* නම් කෘතිය රචනා කිරීම.
- ❖ ගල්තුරුමුල, විල්ගම්මුල ~~[illegible]නාහිමින්~~ වැනි විද්වතුන් සාහිත්‍යකරණයේ නිරතවීම.
- ❖ ඇතැම් පිරිවෙන් (වීදාගම සනානන්ද, තොටගමුවේ විජයබා) මෙකල ආරම්භ වීම.

*(ලකුණු 07 යි)*

### (iv) කෝට්ටේ යුගයේ අධ්‍යාපනය

- ❖ ලංකාව අවසන්වරට එක්සේසත් කිරීම සිදු වූ සයවන පැරකුම්බා රජ සමය කෝට්ටේ රාජධානියේ දීප්තිමත්ම කාලපරිච්ඡේදය විය. එකල පැවති දේශපාලන, ආර්ථික, ආගමික හා ශාසනික දියුණුව මෙන්ම රාජ්‍ය අනුග්‍රහයත් අධ්‍යාපනයේ වර්ධනයට පිටුබලයක් විය.
- ❖ වීදාගම ශ්‍රී සනානන්ද, තොටගමුවේ විජයබා, දෙවුන්දර ඉරුගල්කුලතිලක, කැරගල පද්මාවතී, පැපිලියානේ සුනේත්‍රාදේවි සහ එරබත්ගොඩ ධර්මරාජ යන පිරිවෙන් ප්‍රකට ශාස්ත්‍රායතන වීම.
- ❖ මෙම අධ්‍යාපන ආයතනවල සිටි භික්ෂූන් වහන්සේ විශාල ධර්ම ශාස්ත්‍රීය සේවයක නිරතවීම. ඔවුන් අතරින් කැරගල වනරතන, වීදාගම මෛත්‍රිය, තොටගමුවේ ශ්‍රී රාහුල, වැත්තෑවේ ආදී තෙරවරුන් කැපී පෙනීම.
- ❖ මෙකී අධ්‍යාපන මධ්‍යස්ථානවල සිංහල, පාලි, සංස්කෘත, ප්‍රාකෘත හා දෙමළ වැනි භාෂාද කාව්‍ය, නාටක, ජ්‍යොතිර්විද්‍යා වැනි විවිධ විෂයයන්ද ඉගැන්වීම.
- ❖ ගිහි පැවිදි පඬිවරුන් විවිධ අංශවලට අයත් ග්‍රන්ථ රචනයෙහි නිරත වීම. නිදසුන් වශයෙන් මහාකාව්‍ය, බුදුගුණ කාව්‍ය, සංදේශ කාව්‍ය, උපදේශ ග්‍රන්ථ හා ප්‍රශස්ති ග්‍රන්ථ ආදිය.
- ❖ වනවාසී හා ග්‍රාමවාසී භික්ෂූන් තරඟයට ග්‍රන්ථකරණයෙහි නියැලීම හේතුකොට ගෙන සාහිත්‍ය ප්‍රබෝධයක් හටගැනීම. වනවාසී සම්ප්‍රදාය කැරගල පද්මාවතී පිරිවෙනෙහිද ග්‍රාමවාසී සම්ප්‍රදාය තොටගමුවේ විජයබා පිරිවෙනෙහිද ක්‍රියාත්මක වීම.
- ❖ මෙකල පැවති අධ්‍යාපන ආයතන ජාත්‍යන්තර කීර්තියට පත් වූ බැවින් සංස්කෘත විශාරදයකු වූ ශ්‍රී රාමචන්ද්‍ර භාරතී පඬිවරයා දිවයිනට පැමිණීම.

*(ලකුණු 07 යි)*

Scanned with CamScanner

**(v) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා**

❖ නායක්කර් රාජවංශයට අයත් උඩරට දෙවන පාලකයාය (ක්‍රි.ව. 1747-1781).

❖ ඇතැම් උඩරට ප්‍රධානීන් මෙම රජපත්වීමට විරෝධය පෑම: 1760 මොහුට එරෙහි කුමන්ත්‍රණය.

❖ මොහුට පැවති ප්‍රධාන අභියෝගයක් ලෙස මුහුදුබඩ පළාත්වල පැවති ලන්දේසි බලය දැක්විය හැකිය: 1760-65 උඩරට-ලන්දේසි යුද්ධය; 1766 ගිවිසුම.

❖ බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ ප්‍රධාන අනුග්‍රාහකයා වීම:

- 1753 දී වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමියන්ගේ මූලිකත්වයෙන් සියමෙන් මෙරටට උපසම්පදාව ගෙන්වීම.
- භික්ෂූන් වහන්සේට හා දිවයිනේ පිහිටි විහාරස්ථානවලට අනුග්‍රහ දැක්වීම.
- ශාස්ත්‍රීය පුනරුදයක් ඇතිකිරීම සඳහා අනුග්‍රහ දැක්වීම.
- ශ්‍රී පාදස්ථානය නැවතත් භික්ෂූන් වහන්සේට පවරාදීම.
- සතර මහා දේවාල පෙරහැරට දළදා පෙරහැර එකතු කිරීම.
- කතිකාවත් පිහිටුවීම හා සංඝරාජ, අනුනායකාදී පදවි පිරිනමමින් සංඝ සංවිධානය විධිමත් කිරීම.

*(ලකුණු 07 යි)*

**7. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසීන් හා ලන්දේසීන් අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්ති පහත සඳහන් මාතෘකා යටතේ සංසන්දනය කරන්න.**

**(i) අරමුණු**
**(ii) ස්වදේශීය සමාජ-ආර්ථික සංස්ථා උපයෝගී කර ගැනීම**
**(iii) වෙළඳාම**
**(iv) කෘෂිකර්මාන්තය**

*(ලකුණු 14 යි)*

**(i) අරමුණු**

❖ පොදුවේ පෘතුගීසීන් හා ලන්දේසීන් මෙරට ක්‍රියාත්මක කළ ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණු දෙකක් විය.

- යුරෝපය තුළ ඒ වන විට වෙළඳ වටිනාකමක් පැවති ද්‍රව්‍ය මෙරටින් ලබාගැනීම. (කුරුඳු, ගම්මිරිස් ඇතුළු අනෙකුත් කුළුබඩු.)
- ශ්‍රී ලංකාවේ වරායන් ආශ්‍රිතව මෙතෙක් කල් වෙළඳ කටයුතුවල නියැලුණු ආසියාතු වෙළඳුන්ගේ (චීන, අරාබි, මලබාර්) වෙළඳ ඒකාධිකාරය තමන් අතට පත්කර ගැනීම.

❖ අරමුණු අතින් පෘතුගීසීන් හා ලන්දේසීන් යන යුරෝපීය ජාතීන් දෙපිරිසම තුළ වූයේ හැකිතරම් වෙළඳ වටිනාකමක් සහිත භාණ්ඩ මෙරටින් ලබාගැනීමයි.

Scanned with CamScanner

- ❖ පෘතුගීසි ආර්ථික කටයුතු, පෘතුගීසි දේශපාලන අධිකාරිය විසින් මෙහෙයවන ලද අතර ලන්දේසි ආර්ථික කටයුතු ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම විසින් මෙහෙයවන ලද බැවින් ලන්දේසීන් තුළ ආර්ථික අරමුණ වඩාත් බලවත්ව පැවතීම.

**(ii) ස්වදේශීය සමාජ-ආර්ථික සංස්ථා උපයෝගී කරගැනීම**

- ❖ පෘතුගීසීන් හා ලන්දේසීන් දෙපිරිසම පාරම්පරිකව පැවති ඉඩම් භුක්ති ක්‍රමය ප්‍රයෝජනයට ගැනීම
- ❖ ලංකාවේ ඉඩම් පිළිබඳ තොරතුරු අඩංගු තෝම්බු සකස් කිරීම හරහා පළමුව පෘතුගීසීන් හා දෙවනුව ලන්දේසීන් ආර්ථික වටිනාකමක් සහිත ඉඩම් පිළිබඳ අවබෝධයක් ලබාගැනීම.
- ❖ කුල ක්‍රමය සහ අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය උපයෝගී කරගැනීම.
    - වෙළඳාම සඳහා කුරුඳු සකස් කිරීම හා ඒ ආශ්‍රිත කටයුතුවල නියැලුණු කණ්ඩායම මහ බද්ද, සුළු බද්ද, කුනම් බද්ද ලෙස කොටස් තුනකට බෙදී පැවති අතර පසු කලෙක මහ බද්ද ලෙස කුරුඳු දෙපාර්තමේන්තුවක් ඇතිවන්නේ එම කාණ්ඩ අතුරින් විශාල සංඛ්‍යාවක් නියුක්ත වූ මහ බද්ද කණ්ඩායම පාදක කර ගනිමිනි.
    - පෘතුගීසීන් මෙන්ම ලන්දේසීන් ද එවකට ලංකාවේ පැවති රාජකාරි ක්‍රමය ඔවුන්ගේ පාලන ප්‍රදේශවල පරිපාලනය සහ ආර්ථික කටයුතු පවත්වාගෙන යාමේදී ඉතා හොඳින් භාවිතා කරන ලදි. ඇල මාර්ග සකස්කිරීම
- ❖ බදු ක්‍රමය උපයෝගී කරගැනීම.
    - මරාල බද්ද හා පොල් බද්ද (පොල් අය) පෘතුගීසීන් හා ලන්දේසීන් තමන්ගේ අවශේෂ ආදායම් මාර්ග ලෙස උපයෝගී කරගැනීම. විශේෂයෙන් පෘතුගීසීන් මරාල බද්ද කතෝලික ආගම ව්‍යාප්ත කිරීමේ කාර්යය සඳහාද යොදාගැනීම.

**(iii) වෙළඳාම**

- ❖ ඇතැම් ද්‍රව්‍ය සම්බන්ධයෙන් පෘතුගීසීන් මෙන්ම ලන්දේසීන් ද වෙළඳ ඒකාධිකාරයක් පවත්වාගෙන යාම (කුරුඳු, අලි ඇතුන් වෙළඳාම, මැණික් ගැරීම හා විකිණීම, මුතු කිමිදීම).
- ❖ ප්‍රධාන ආදායම් උපයන භාණ්ඩ ලෙස ඇතැම් බෝග හඳුනාගෙන ඒවා වෙළඳාම් කිරීම (පුවක්).
- ❖ උඩරට රාජධානිය සමග අභ්‍යන්තර වෙළඳාමක් පවත්වාගෙන යාම.
- ❖ ලුණු, කරවල වැනි දෑ උඩරටටත්, එම ප්‍රදේශයෙන් ගම්මිරිස්, බුලත්, කරාබු නැටි, කරදමුංගු, මී ඉටි, මී පැණි ඇතුළු ද්‍රව්‍ය සමූහයක් වෙරළබඩ ප්‍රදේශවලටත් තවලම් මගින් ප්‍රවාහනය කිරීම.
- ❖ ආනයන අපනයන වෙළඳාමක් පවත්වාගෙන යාම.
- ❖ අන්තර්-ආසියාතික වෙළඳාමට සම්බන්ධ වීම.

**(iv) කෘෂිකර්මාන්තය**

- ❖ ආණ්ඩුවේ වියදම් අඩුකර ගැනීමේ අරමුණින් සහල් නිෂ්පාදනය පවත්වාගෙන යෑම.
    - මෙහි දී විශේෂයෙන්ම ලන්දේසීන් සහල් (ආනයන) අපනයනය කිරීමට සිදුවුවහොත් වෙළඳ සමාගමට දැරීමට සිදුවන පාඩුව වළක්වා ගැනීමේ අරමුණින්

Scanned with CamScanner

මුතුරාජවෙල අස්වැද්දීම සහ කිරම, ඌරුබොක්ක වැනි ප්‍රදේශ පදනම් කරගෙන වැව් ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගැනීම.

- කපු වැවීම, සහ රෙදි සායම්කරණය සඳහා භාවිතා කළ ඉන්ඩිගෝ වැවීම සිදුකරන ලදි.
- ලන්දේසීන් ඇතැම් ප්‍රදේශවල කුරුඳු වගා කිරීමට පියවර ගැනීම. උදා: කදිරාන, ඇවරිවත්ත, කුරුඳුවත්ත

❖ යටත්විජිතවාදී දෘෂ්ඨියෙන් බලන කල පෘතුගීසීන්ට සාපේක්ෂව ලන්දේසීන්ගේ ආර්ථික ප්‍රතිපත්තිය සාර්ථක වී යයි කිව හැකිය.

*(ලකුණු 14 යි)*

**8. "1817-18 උඩරට බ්‍රිතාන්‍ය විරෝධී සටන ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව ඇති වූ ප්‍රබලතම ජනතා නැගී සිටීමක් විය."**

**(i) 1817 දී ජනතා නැගිටීම ආරම්භ වූ ස්ථානය නම් කරන්න.**

ඌව-වෙල්ලස්ස

*(ලකුණු 01 යි)*

**(ii) එම සටනට නායකත්වය දුන් දෙදෙනෙකු නම් කරන්න.**

කැප්පෙටිපොල, ඇල්ලෙපොල, මඩුගල්ලෙ, කිවුලේගෙදර මොහොට්ටාල, පිළිමතලව්වේ (කණිෂ්ඨ), බුටෑවේ රටේ රාළ.

*(ලකුණු 02 යි)*

**(iii) එම සටන ඇතිවීමට තුඩු දුන් සාධක පිළිබඳ ව කෙටි විස්තරයක් ඉදිරිපත් කරන්න.**

❖ උඩරට රජු සිහසුනෙන් පළවාහැර එහි ස්වදේශික රාජාණ්ඩුව සහ රාජත්වය අහෝසි කළ ඉංග්‍රීසීන් එංගලන්තයේ රජු එම ප්‍රදේශවල රජු ලෙස ප්‍රකාශයට පත්කිරීම හේතුකොටගෙන භික්ෂූන් වහන්සේ, රදළ ප්‍රධානීන් සහ සාමාන්‍ය ජනතාව යන සියලු කොටස් බ්‍රිතාන්‍ය පාලනය කෙරෙහි අප්‍රසාදයට පත්වීම.

❖ බ්‍රිතාන්‍ය පාලකයන් විසින් 1815 ගිවිසුමේ වගන්ති කඩකිරීම.

- 5 වන වගන්තිය කඩකිරීම - බ්‍රිතාන්‍ය පාලකයන් භික්ෂූන් වහන්සේට ගරු සත්කාර කරන බවටත් විහාර හා දේවාලගම් ආරක්ෂාකරන බවටත් 5 වන වගන්තියෙන් පොරොන්දු වූ නමුත් ක්‍රිස්තු භක්තිකයන් වූ එම පාලකයන්ට එකී පොරොන්දුව ඉටුකළ නොහැකි වීම.

❖ ඔවුන් ක්‍රිස්තු භක්තිකයන් වීම නිසාත් බෞද්ධ සිරිත් විරිත් නොදන්නා නිසාත් එම සිරිත් විරිත් ආරක්ෂා කිරීමට අපොහොසත් වීම හේතුකොටගෙන භික්ෂූන් වහන්සේ බ්‍රිතාන්‍ය පාලකයන් කෙරෙහි කලකිරීම.

Scanned with CamScanner

❖ රදළ ප්‍රධානීන්ගේ නිලතල, බලතල හා වරප්‍රසාද ආරක්ෂාකරන බවට 4 වන වගන්තියෙන් පොරොන්දු වූ නමුත් එය හරිහැටි ඉටු නොකිරීම. මඩිගෙ ලේකම් තනතුරට සිංහල රදළවරුන්ට තිබූ අයිතිය අහිමිකොට හජ්ජි මරික්කාර්ට එම තනතුර ලබාදීමෙන් ජනතාව තුළ අප්‍රසාදයක් හටගැනීම.

❖ බ්‍රිතාන්‍ය පාලකයන් භික්ෂූන් වහන්සේට සහ රදළ ප්‍රධානීන්ට නිසි ගෞරව කිරීම ගැන සාමාන්‍ය ජනතාවද කලකිරීමට පත්වීම.

(ලකුණු 05 යි)

**(iv)** ඉහත සඳහන් ප්‍රකාශය විවේචනාත්මක ව විමසන්න.

❖ 1817 සැප්තැම්බර් මස ඌව ප්‍රදේශයෙන් ආරම්භ වූ සටන 1818 මුල දක්වා ඌව-වෙල්ලස්ස ප්‍රදේශයට සීමා වූ නමුත් එතැන් පටන් එම සටන සබරගමුවේ කොටසක්, තුන් කෝරළය හා හතර කෝරළය හැර උඩරට රාජ්‍යයට අයත්ව පැවති සෙසු ප්‍රදේශ පුරාම ව්‍යාප්ත වීම.

❖ දන්ත ධාතුන් වහන්සේ සටන්කරුවන් අතට පත්වීම.

❖ සටනේ අරමුණ ඉංග්‍රීසීන් පළවා හැරීම බව සටනේ නායකයන් ප්‍රකාශ කිරීම.

❖ මොල්ලිගොඩ හැරෙන්නට සෙසු බලවත් රදළ ප්‍රධානීන් සියලු දෙනාම පාහේ සටනට සහාය දැක්වීම.

❖ සටන පැතිරුණු ප්‍රදේශවල සාමාන්‍ය ජනතාවද රදළ ප්‍රධානීන් සමග උරෙනුර ගැටී රදළ ප්‍රධානීන් සමග සටනට අවතීර්ණ වීම.

❖ සටන්කරුවන් ගරිල්ලා සටන් ක්‍රමය උපයෝගී කරගැනීම නිසා ඉංග්‍රීසි සොල්දාදුවන් මහත් අසීරු තත්ත්වයටම පත්වීම.

❖ ලෙඩරෝගවලට ගොදුරු වූ ඉංග්‍රීසි සොල්දාදුවන් විශාල ලෙස මරණයට පත්වීම.

❖ මෙම තත්ත්වය යටතේ සටන දරුණු ලෙස ඇවිළී යාම හේතුකොටගෙන 1818 අප්‍රේල්-මැයි පමණ ඉංග්‍රීසීන් උඩරට ප්‍රදේශ අතහැර යාමට පවා කල්පනා කිරීම.

❖ මෙම සියලු කරුණු සැලකිල්ලට ගත් විට මෙම සටන ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව ඇති වූ ප්‍රබලතම ජනතා නැගී සිටීමක් ලෙස සැලකිය හැකිවීම.

❖ මෙම සටන මර්දනය කිරීම සඳහා ඉංග්‍රීසීන් අතිශය දරුණු ක්‍රියාමාර්ග අනුගමනය කිරීම හා ඉන්දියාවෙන් පවා අතිරේක හමුදා ගෙන්වාගැනීමට ඔවුන්ට සිදුවීමෙන්ද පෙනී යන්නේ මෙම සටනේ ප්‍රබල බවයි.

[1797 හා 1848 සටන් සමග සන්සන්දනය කරමින් කරුණු ඉදිරිපත් කරන්නේ නම් එවැනි පිළිතුරුවලට වැඩි ලකුණු ලබාදිය යුතුය.]

(ලකුණු 06 යි)

Scanned with CamScanner

9. <u>එක්කෝ (A)</u> කොටසට <u>නැතහොත් (B)</u> කොටසට පමණක් පිළිතුරු සපයන්න.

**(A)** ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පහත දැක්වෙන ශීර්ෂ යටතේ සාකච්ඡා කරන්න.

(i) සර්වජන ඡන්දබලය
(ii) ආණ්ඩුකාරයා
(iii) විධායක කාරක සභා ක්‍රමය හා අමාත්‍ය මණ්ඩලය

*(ලකුණු 14 යි)*

**(A) ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ**

එවකට මෙහි පැවති ආණ්ඩු ක්‍රමයේ (1924 මැනිං-ඩෙවොන්ෂයර්) අඩුපාඩු පරීක්ෂා කොට යෝජනා ඉදිරිපත් කිරීම සඳහා 1927 දී ඩොනමෝර් කොමිෂන් සභාව මෙරටට පත්කොට එවනු ලැබීය.

1931 දී ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී.

**(i) සර්වජන ඡන්ද බලය**

- මෙතෙක් ඡන්ද බලය හිමිවුණේ මුළු ජනගහණයෙන් 4% කට පමණි.
- පුළුල් ඡන්ද බලයකින් තෝරාගනු ලබන නියෝජිතයන්ගෙන් යුත් ව්‍යවස්ථාදායකයකින් ජනතාවගේ සුබ සිද්ධිය පිණිස වඩාත් ඵලදායී අන්දමින් කටයුතු කළ හැකිය යන විශ්වාසය, සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීමට පාදක වීම.
- මෙම යෝජනාවට ඒ. ඊ. ගුණසිංහ හැරුණු විට සෙසු ජාතික නායකයන් සියලු දෙනාම පාහේ විරුද්ධ වීම.
- ජාතිමූල නියෝජනය අහෝසි කිරීම.
- වයස අවුරුදු 21 ට ඉහළ සෑම කෙනෙකුටම ඡන්ද බලය හිමිවීම. මුලදී ස්ත්‍රීන්ට වයස අවුරුදු 30 ත් පුරුෂයින්ට වයස අවුරුදු 21 ත් ලෙස තීරණය කර තිබුණත්, පසුව වයස අවුරුදු 21 ට වැඩි සියලුම දෙනාට ඡන්ද බලය හිමිවීම.

**(ii) ආණ්ඩුකාරයා**

- ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ආණ්ඩුකරු සතු බලතල සීමා සහිත වීම.
- ව්‍යවස්ථාදායකය හෝ අමාත්‍ය මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබන ඉක්මන් හෝ අපරීක්ෂාකාරී ක්‍රියා වැළැක්වීම ආණ්ඩුකාරයාගේ වගකීම වීම.
- ආණ්ඩුකාරයා සතු බලතල:
  - රාජ්‍ය මන්ත්‍රණ සභාව ඇමතීමේ බලය
  - ආකාර කිහිපයකින් රාජ්‍ය මන්ත්‍රණ සභාව සම්මත කරනු ලබන පනත් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට තිබූ බලතල
    - ✓ පනතට එක එල්ලේම එකඟවීම
    - ✓ මහරජතුමාගේ අනුමැතිය ලැබෙන තෙක් ඊට එකඟ නොවීම
    - ✓ පනතක් සංශෝධන සහිතව හෝ රහිතව හෝ රාජ්‍ය මන්ත්‍රණ සභාව වෙත යළිත් සලකා බැලීම සඳහා යොමු කිරීම.

- ✓ වැදගත් ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක් අඩංගු පනත් සහතික කොට එය නීතිගත කිරීම සඳහා මන්ත්‍රණ සභාවේ 2/3 ක ඡන්දය ඉල්ලා සිටීම.
- ✓ පනතට එකඟ වී එය ක්‍රියාවේ යෙදවීම හයමසකට කල්තැබීම
- ✓ පනත මුළුමනින්ම ප්‍රතික්ෂේප කිරීම

❖ තමා ගනු ලබන තීන්දු තීරණ සැමවිටම යටත් විජිත භාර මහලේකම්ට වාර්තා කිරීම.

❖ හදිසි අවස්ථාවකදී හෝ එසේ අවස්ථාවක් පැනනැගී ඇතැයි හැඟෙන විට ඕනෑම දෙපාර්තමේන්තුවක පාලනය සියතට ගැනීම.

❖ රාජ්‍ය සේවාවේ සේවකයින් පත්කිරීම, මාරු කිරීම, අස්කිරීම හා ඔවුන් පිළිබඳ විනයානුකූල පාලනය සම්බන්ධ පාලනය.

**(iii) විධායක කාරක සභා ක්‍රමය හා අමාත්‍ය මණ්ඩලය**

❖ විධායක කාරක සභා 7 ක් පිහිටුවිය. ඒවා නම්,

1. ස්වදේශීය කටයුතු
2. කෘෂිකර්මය
3. පළාත් පාලනය
4. සෞඛ්‍යය
5. කම්කරු කර්මාන්ත හා වෙළඳ කටයුතු
6. අධ්‍යාපනය
7. සන්නිවේදනය, ගමනාගමනය හා ප්‍රසිද්ධ වැඩ

❖ විධායක කාරක සභාවක සාමාජික සංඛ්‍යාව අටකට නොවැඩි හතකට නොඅඩු විය.

❖ අමාත්‍ය මණ්ඩලය සකස් වී තිබුණේ මෙම විධායක කාරක සභා හතේ ප්‍රධානීන්ගෙන් සහ නීති ලේකම්, රාජ්‍ය ලේකම්, මුදල් ලේකම් යන රාජ්‍ය නිලධාරීන් තිදෙනාගෙනි.

❖ රාජ්‍ය මන්ත්‍රණ සභාව සාමාජිකයන් 61 දෙනෙකුගෙන් සමන්විත වීම.

*(ලකුණු 14 යි)*

**(B)** 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්‍ෂණ පරීක්‍ෂා කරන්න.

❖ ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකයඃ මෙය ජාතික රාජ්‍ය සභාව ලෙස හැඳින්වීම; ජනතා ස්වාධිපත්‍යය සහතික කරමින් එය ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත වීම.

❖ නාමික විධායකයඃ අගමැති විසින් පත් කරන ලද ජනාධිපති.

❖ නියම විධායකයඃ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය.

❖ මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයකින් යුක්ත වීම.

❖ බුද්ධාගමට ප්‍රමුඛස්ථානයක් ලබාදෙන අතරම සෙසු ආගම් ඇදහීමේ නිදහස පිළිගෙන තිබීම.

❖ 1948 සිට ක්‍රියාත්මක වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා අධිකරණ සේවා කොමිෂන් සභාව අවලංගු කොට එම බලතල කැබිනට් මණ්ඩලයට පැවරීම.

❖ 1948 සිට බලපැවති එංගලන්තයේ ප්‍රිවි කවුන්සිලයට අභියාචනා කිරීමට තිබූ බලය අවලංගු කිරීම.

❖ මෙරට ස්වෛරීභාවය තහවුරු කරන ලද ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය වශයෙන් පිළිගැනීම.

*(ලකුණු 14 යි)*

*****